**හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020, 2021 හා 2022 වර්ෂ වලට අදාළව පෞද්ගලික ආයතනයකින් ලැබිය යුතු එකතු වටිනාකම රු.25,720,955 ක් වූ සියයට එකක වෙළඳ බලපත්‍ර ගාස්තුව සභාවට නොගෙවීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් සටහනක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | මයුරපුර සති පොළෙහි වෙළඳ කුටි සහිත නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ වියදම වූ රු.9,144,138 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු කළමනාකරණ තොරතුරු පද්ධති 04 ක එකතු වටිනාකම වූ රු.720,000 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අස්පෘශ්‍ය වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ජංගම නොවන වත්කම් යටතේ ප්‍රාග්ධනීත කළ නොහැකි රු.642,301 ක පුනරාවර්ථන ස්වරූපයේ වියදම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | එකතු වටිනාකම රු.547,000 ක් වූ ප්‍රාග්ධන වියදම් අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයන්හිදී විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු.403,416 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිවිසුම්ගත නොවූ ආදායම් ලැබියයුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සෘජු ශ්‍රම පදනමින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 03 ක ඉදිකිරීම් කටයුතු වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණද ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කළ රු.354,534 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් නිමකළ පසු වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඌ) | අඩුවෙන් ප්‍රතිපූර්ණය වූ ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් වියදම් රු.66,948 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබියයුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉඩම් ගොඩනැඟිලි ගිණුම් විෂයයට අදාළ ශේෂය හා ඊට අදාළ උපයෝගී ලේඛන උපලේඛනවල දැක්වෙන ශේෂය අ / රු 43,851,826.ක වෙනසක් විය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.21,131,887 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන, ලිපිගොනු, ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කළ නොහැකි බව සහ ඇතැම් ශේෂ හඳුනාගත නොහැකි දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ ආඥා පනතේ 20 වගන්තිය | වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරුකර වරිපනම් බදු අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2010 හා 2011 වර්ෂවල තක්සේරුව මත පදනම්ව අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය පිළිවෙලින් වර්ෂ 08 ක් හා වර්ෂ 07 ක් විය. | තක්සේරු කටයුතු සිදු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගත වී ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | i. මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් අදාළ කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවත්, රු.179,299 ක් වූ අත්තිකාරම් ශේෂය සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබූ අතර මෙම ශේෂය තුළ 2010, 2011 හා 2012 වර්ෂයන්ට අදාළව හඳුනාගත නොහැකි රු.116,049 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි. | හඳුනාගත නොහැකි ශේෂයක් බව | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii.මුදල් රෙගුලාසි 571 (3) | තැන්පත් ශේෂය තුළ සහ ණයහිමි ශේෂය තුළ ඇති වසර 02 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.1,304,791 ක් වූ ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සොයා බලා අදාළ අංශ වෙත ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වියදම් ණයහිමි ශේෂය හා පොදු සැපයුම් ණයහිමි ශේෂය ආදායමට ගැනීමට නොහැකි බවත්, අනෙක් තැන්පතු සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජුනි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය | මියගිය හා විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු.230,955 ක ආපදා ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.19,000 ක මුදලක් අයවී ඇති බවත්, ඉතිරි රු.211,955 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන බව | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,375,211 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.584,183 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 683,606 | 764,606 | 819,264 | 877,784 | 4,179,120 | 4,280,694 | 4,954,562 | 932,442 |
| කුලී | 24,016,200 | 24,072,754 | 23,975,892 | 109,360 | 16,185,136 | 18,624,506 | 18,758,015 | 12,498 |
| බලපත්‍ර ගාස්තු | 12,143,291 | 2,053,703 | 2,230,903 | 65,000 | 10,957,042 | 2,028,652 | 2,633,482 | 242,200 |
| වෙනත් ආදායම් | 10,527,970 | 10,323,856 | 10,995,178 | 834,444 | 5,353,800 | 5,087,457 | 4,329,770 | 1,505,766 |
| **එකතුව** | **47,371,067** | **37,214,919** | **38,021,237** | **1,886,588** | **36,675,098** | **30,021,309** | **30,675,829** | **2,692,906** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු වරිපනම් බදු රු.840,984 ක් අයකර ගැනීමට හා 2023 වර්ෂයේදී දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කළ ග්‍රාම නිලධාරී වසම් 05 ක වරිපනම් අයකරන සීමාව ප්‍රතිශෝධනය කිරීමට පිළිවෙළින් ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා134(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වරිපනම් රු.68,068 ක් අයකර ගෙන ඇති බව, රු.105,768 ක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කරන බව හා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නව වරිපනම් සංශෝධන ආරම්භ කර නොමැති බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට හා වරිපනම් සීමාව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දැන්වීම් පුවරු ගාස්තු රු.84,800 ක් අඩුවෙන් බිල්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු පුවරු ගාස්තු රු.54,000 ක් අයකර නොතිබුණි. එසේම සමීක්ෂණ වාර්තාවට ඇතුලත් නොවූ දැන්වීම් පුවරු 29 කින් ලැබිය යුතු ගාස්තු රු.220,200 ක් ද බිල්කර නොතිබුණි. | අඩුවෙන් බිල්කිරීම් හා සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නොවූ දැන්වීම් පුවරු ගාස්තු 2024 වර්ෂයේදී අයකර ගන්නා බව හා නොලද ගාස්තු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ සභාව විසින් ස්ථාපනය කර නඩත්තු කරනු ලබන වීථි පහන් සංඛ්‍යාව හඳුනා ගැනීමට සමීක්ෂණයක් සිදුකර ඒවා අංකනය කර ලේඛනගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සභා කළමනාකාරිත්වය කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව වෙනුවෙන් දරන ලද වියදම රු.3,034,816 ක් විය. | වසම් 06 ක සංගණන කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි වසම් 17 හි සංගණන කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බව | සංගණන කටයුතු කඩිනමින් සිදුකර ඒ මත පදනම්ව වියදම් දැරීම සිදුකළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව භුක්ති විඳින ඉඩම් 07 ක, ක්‍රීඩා පිටි 10 ක, සුසාන භූමි 29 ක සහ ප්‍රජා ශාලා 10 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාළ පවරා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කරන බව | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | රු.8,483,140 ක වියදමක් දරා 2021 වර්ෂයේදී වැඩ නිමකර තිබූ වියළි කලාපී උද්භිද උද්‍යානය අසල රථ වාහන නැවතුම් අංගනය නිශ්කාර්යව පැවතීම නිසා දරන ලද වියදම ඵලදායී නොවන වියදමක් බවට පත්ව තිබුණි. | යටිතල පහසුකම් සැපයීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට හැකිවන පරිදි කටයුතු කළයුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) ඡේදය අනුව මිලදී ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය මිල කැඳවීම් ලිපියේ සඳහන් කළ යුතු වුවත්, එකතු වටිනාකම රු.1,312,500 ක් වූ 15W LED (Green) බල්බ් 750 ක් මිලදී ගැනීමට අදාළව ආයතන 03 ක් වෙත යොමුකරන ලද මිල කැඳවීම් ලිපිවල මිලදී ගැනීමට අපේක්ෂිත ඒකක ප්‍රමාණය හා වගකීම් කාලය සඳහන් කර නොතිබූ අතර තොග වශයෙන් මිලදී ගැනීමේදී සභාවට ලබාගත හැකිව තිබූ මිල වට්ටම් පිළිබඳව අවධානය යොමු නොකර මිලදීගෙන තිබුණි. | 2024 වර්ෂයේදී මිල කැඳවීම් ලිපි ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය කරුණු ඇතුළත් කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) වගන්තිය අනුව මිලදීගත යුතු ටයර් සඳහා මිල ගණන් කැඳවීමට පෙර පිරිවිතර සකස් කළ යුතු වුවත්, අවස්ථා 03 කදී එකතු වටිනාකම රු.509,400 ක් වූ ටයර් හා ටියුබ් | ඉදිරියේදී පිරිවිතර දක්වා මිල ගණන් කැඳවීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන |

| | | | |
|---|---|---|---|
| | මිලදීගෙන තිබූ අතර මිල කැඳවීම් ලිපිවල පිරිවිතර ලෙස වගකීම් කාලය, ධාවනය කළ හැකි කිලෝමීටර් ගණන, කම්බි පොටවල් ගණන ආදී වැදගත් පිරිවිතර අයිතමයන් දක්වා නොතිබුණි. | | අනුව කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ සභා අරමුදල් යටතේ රු.1,000,000 ක ඇස්තමේන්තුවක් සකස් කර බඳගිරිය සැනසිලිගම මාවත බොරළු යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඉදිකිරීමේ කටයුතු 2023 ජුනි 27 දිනට ප්‍රථම නිමකළ යුතු වුවත්, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 14 දින වන විටත් නිමකර නොතිබූ අතර එදිනට අයකළ යුතු ප්‍රමාද ගාස්තුව රු.85,000 ක් විය. | මේ වන විට රු.298,265 ක වැඩ කොටස් නිමකර ඇති බව | ගිවිසුම්ගත පරිදි ඉදිකිරීම් කටයුතු නිම කළයුතු අතර ගෙවීම් කිරීමේදී ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | මයුරපුර සතිපොළ වාහන නැවතුම්පොළ ඉදිකිරීමේ කර්මාන්තය රු.7,902,800 කට කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. ගිවිසුම්ගත වැඩ කොටස්වල ඇතුළත්ව තිබූ රු.3,919,998 ක වැඩ කොටස් කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකර අතහැර දමා තිබියදී ඉටුකර තිබූ වැඩ කොටස් සඳහා රු.2,785,998 ක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට මෙම භූමියෙහි වල් බිහිවී තිබීම නිසා වැය කරන ලද රු.2,785,998 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ප්‍රමාද ගාස්තු රු.790,280 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ බව | දරණ ලද වියදමට ප්‍රතිලාභ ලැබෙන පරිදි කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු නිමකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කලයුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 53 ක් හා 71 ක් වූයෙන් තනතුරු 07 කට අදාළ අතිරික්තතා 22 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ද්විතීක මට්ටමේ තනතුරු අතිරික්තතා අනුමත කර ගැනීමටත් ප්‍රාථමික මට්ටමේ අතිරික්ත තනතුරු සේවා අවශ්‍යතාවය මත පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත බඳවා ගෙන ඇති බව | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් හතර දෙනෙකු හා ආදේශක සෞඛ්‍ය කම්කරුවෙකු වෙත අනුමත රාජකාරියෙන් බැහැර වෙනත් රාජකාරී පවරා තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,047,005 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | අනුමත රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරි කටයුතු සේවා අවශ්‍යතාවය මත පවරා ඇති බව | සේවකයන් අනුමත රාජකාරියෙහි යෙදවිය යුතුය. |